**"කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා"**
**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂිකර්ම අමාත්‍යාංශය**

# කෘෂි රක්ෂණ හා සමාජ ආරක්ෂණ සේවාවන් ගොවි ජනතාව අතරට රැගෙනයාම සඳහා මෙහෙයුම් හා අලෙවි නියෝජිතයින් බඳවා ගැනීම - 2023

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය; දේශීය කෘෂිකර්මාන්තයේ අවදානම අවමකර, ගොවි ජනතාවගේ ආර්ථික ස්ථායීතාවය සුරක්ෂිත කර, දේශීය කෘෂිකර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් මහඟු සේවාවන් රැසක් ඉටුකරන කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනයකි.

අපගේ සේවාවන් ;

සියලුම ආකාරයේ වගා රක්ෂණ
පශු සම්පත් රක්ෂණ
ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම
ගොවීන්ගේ සියලු චංචල / නිශ්චල දේපල රක්ෂණ

***ඔබ ක්‍රියාශීලීද? ඉලක්ක පසුපස හඹා යා හැකිද? ආත්ම විශ්වාසයෙන් පිරිපුන්ද? වෘත්තීය ජීවිතයේ සුවිශේෂී පියවර තබමින්, අමතර ආදායමක් ලබමින් දියුණුව කරා පෙරට යාමට අප හා එක්වන්න.***

**<u>සුදුසුකම් හා පළපුරුද්ද :</u>**

- ✓ ශ්‍රී ලාංකීය පුරවැසියෙකු වීම.
- ✓ වයස අවුරුදු 18ට වැඩි වීම හා මනා චරිතයකින් යුක්තවීම.
- ✓ ක්‍රියාත්මක Smart ජංගම දුරකථනයක් සතුවීම හා මූලික හැසිරවීමේ කටයුතු පිළිබඳ දැනුවත්බව.
- ✓ මනා පෞරුෂත්වයකින් යුක්ත වීම හා සන්නිවේදන හැකියාවක් තිබීම.
- ✓ අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.
- ✓ අලෙවිකරණ ක්ෂේත්‍රයේ අත්දැකීම් හෝ සේවා සැපයීම පිළිබඳ පලපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් වේ.
- ✓ දැනටමත් රැකියාවක නියුතු වූවකුටද මේ සඳහා අයදුම් කළ හැක.

**<u>කාර්යයේ වගකීම් :</u>**

- ➢ මණ්ඩලයේ විකුණුම් ඉලක්ක සපුරා ගැනීම සඳහා අප සේවාවන් ජනතාව තුළ ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.
- ➢ අලෙවිය සම්බන්ධයෙන් ව්‍යාපාර සැලසුම් කිරීම හා කළමණාකාරිත්වය වෙත නිවැරදිව කාලීන වාර්තා ලබා දීම.
- ➢ ඉලක්ක සපුරා ගැනීමට ප්‍රාදේශීය කළමණාකාරීත්වයට උපරිමයෙන් සහයෝගය ලබාදීම.
- ➢ නිරන්තරයෙන් අලෙවිය වර්ධනය සහ වෙළඳපල පිළිබඳව මනා අවබෝධයෙන් කටයුතු කිරීම.
- ➢ කළමණාකාරීත්ව තීරණ සඳහා අවශ්‍යය තොරතුරු සැපයීම.
- ➢ පාරිභෝගිකයන් වෙත කාර්යක්ෂම සේවාවක් සැපයීම.
- ➢ මණ්ඩලයේ අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණ කටයුතු සඳහා දායකත්වය සැපයීම.

**<u>ප්‍රතිලාභ :</u>**

- ❖ ඔබ සිදුකරන කාර්යයන්හි ප්‍රගතිය මත ආකර්ෂණීය ගෙවීම් සිදුකෙරෙන අතර මූලික වැටුප් රහිතය.
- ❖ හැකියාව මත රුපියල් 100,000ක් ඉක්මවා මාසික ආදායමක් උපයාගත හැකිවීම.
- ❖ රාජ්‍ය අංශය සමඟ එක්ව කටයුතු කිරීමෙන් සමාජීය වශයෙන් ඇතිවන විශ්වසනීයභාවය.
- ❖ රැකියාවන්හි නියුතු අයට අමතර ආදායම් මාර්ගයක්වන අතර, රැකියා වියුක්ත අයට ස්වයං රැකියාවක් ලෙස කිරීමේ හැකියාව පැවතීම.
- ❖ ඉලක්ක සපුරන නියෝජිතයන්ට නොමිලේ ජීවිත රක්ෂණයක් හා විශ්‍රාම වැටුපක්.
- ❖ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා බඳවාගන්නා විටෙක අමතර සුදුසුකමක් වීම.
- ❖ මණ්ඩලීය කටයුතු පිළිබඳව කෙටි කාලීන පුහුණුවකින් පසු සේවයේ යෙදවීම.

**<u>බඳවා ගන්නා ප්‍රදේශ :</u>**

- සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි නියෝජිතයින් බඳවා ගන්නා බැවින් ග්‍රාම සේවා වසම් මට්ටමින් අයදුම්කළ යුතුය.
- තනි පුද්ගල නමින්, ආයතන නමින්, සමිති / සමාගම් නමින් අයදුම්කළ හැකිය.
- අර්ධ කාලීන හා සති අන්තයන්හි සේවය කළ හැකි බැවින් සියළුම රාජ්‍ය / අර්ධ රාජ්‍ය නිලධාරීන්ට අයදුම්කළ හැකිය.

**සුදුසුකම්ලත් අයදුම්කරුවන්, මෙම දැන්වීම පළවූ දින සිට එනම් 2022.12.28 දින හෝ එදිනට ප්‍රථම පහත මාර්ගගත දිගුව (Google Link) භාවිතාකර අදාල තොරතුරු සම්පූර්ණ කළ යුතුය. ඉන්පසුව ඔබගේ අයදුම්පත පහත ලිපිනයට යොමු කරන්න. අයදුම්පත්‍රය www.aib.gov.lk වෙබ් අඩවියෙන් බාගත කිරීමෙන් හෝ ඔබ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ කාර්යාලයෙන් ලබාගත හැකිය. තැපැල් මඟින් අයදුම් කිරීමේදී, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි හෝ විද්‍යුත් තැපැල වන chairman@aib.gov.lk මඟින් අයදුම් කිරීමේදී විෂය තීරුවේ අදාල තනතුර සඳහන් කළ යුතුය. දිස්ත්‍රික් මට්ටමින් කරනු ලබන සම්මුඛ පරීක්ෂණයන් මඟින් අයදුම්කරුවන් බඳවා ගැනේ.**

**Google Link:** https://docs.google.com/forms/d/e/1FAIpQLSf8vwOCmY-zkaiUQVJFRv1FShDep5hmvCdXIFI60VqeiJBZ-Q/viewform?usp=sf_link

**සභාපති,**
**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය,**
**නො.117, සුභද්‍රාරාම පාර,**
**ගංගොඩවිල, නුගේගොඩ.**

වැඩි විස්තර : **සියළුම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙන් ( දු.ක. : 011 238 4000 ) හෝ ක්ෂණික ඇමතුම් : 1918 මඟින් ලබාගත හැක.**